# මාධ්‍ය සටහන

## ශ්‍රී ලංකාව සඳහා ජාතික ගිණුම් ඇස්තමේන්තු ගණනය කිරීමේ පදනම් වර්ෂය සංශෝධනය කිරීම සහ ක්‍රමවේදය වැඩිදියුණු කිරීම

### 1. පසුබිම

2007 වසර වනතෙක්ම, ජාතික ගිණුම් ගණනය කරණ ලද්දේ ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) මෙන්ම ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසිනි. එනමුදු, ඉන්පසු ජාතික ගිණුම් ගණනය කිරීම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ (DCS) වගකීම බවට පත්ව ඇත. විශේෂයෙන්ම, දළ දේශීය නිෂ්පාදිතය හා ආර්ථික වර්ධන වේගය යන දර්ශකද්වය ප්‍රධානතම ජාතික ගිණුම් දර්ශක ලෙස ගැණේ. මුදල් හා රාජ්‍ය ආදායම් මත ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හේතු පාදක කර ගන්නා සමාජයීය - ආර්ථික විග්‍රහයන් උදෙසා මෙම දර්ශක භාවිතයට ගැණේ.

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කරනු ලබන්නේ සමස්ථ ආර්ථිකය සඳහාම නිමැවුම් වටිනාකමින් අතරමැදි යෙදවුම් වටිනාකම අඩු කොට ලබා ගන්නා දළ එකතු කළ අගයට භාණ්ඩ මත අය කෙරෙන බදු එකතු කොට එම සහනාධාර අඩු කිරීමෙනි. 2002 වසරේ සිට වාර්ෂික මෙන්ම කාර්තුමය වශයෙන් දළ දේශීය නිෂ්පාදිතය ප්‍රකාශයට පත්වෙමින් පවතී. මේ දක්වා, ආර්ථික වර්ධන වේගය ගණනය කර ඇත්තේ, 2002 වසර, පදනම් වර්ෂය ලෙස භාවිතා කරමිනි. සාමාන්‍යයෙන්, ආර්ථිකයේ වෙනස්වීම් නිරූපණය අරමුණු කොට ගෙන, වසර පහකට වරක් එකී පදනම් වර්ෂය සංශෝධනය කළ යුතු වෙයි. ඒ අනුව, පදනම් වර්ෂය 2002 වසර වෙනුවට 2010 වර්ෂය ලෙස සංශෝධනය කිරීමට ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) තීරණය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව හා අනෙකුත් අදාළ ආයතන දැනුවත් කරමින් නිෂ්පාදන ප්‍රවේශය භාවිතා කරමින්, 2010 සිට 2014 දක්වා වාර්ෂික සහ කාර්තුමය ජාතික ගිණුම් ගණනය කිරීමට දෙපාර්තමේන්තුව පියවර ගෙන ඇත. එසේම, 2015 දෙවන කාර්තුවේ සිට, 2010 නව පදනම් වසර පාදක කර ගනිමින් සකස් කෙරෙණ ජාතික ගිණුම් ඇස්තමේන්තු, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව (DCS) විසින් ප්‍රකාශයට පත් කෙරෙණු ඇත.

## 2. විස්තරය

ජාතික ගිණුම් ගණනය කිරීමේ පදනම් වර්ෂය සංශෝධනය කිරීමෙහිදී, පැරණි පදනම් වර්ෂය වඩාත් ආසන්න නව වසරක් කරා පමුණුවාලීමට අමතරව, වෙනත් වැඩිදියුණු කිරීම් ද කර ඇත. පහත දැක්වෙන්නේ, නව පදනම් වර්ෂය යටතේ ගණනය කරණ ලද ජාතික ගිණුම්වල විශේෂ නෛසර්ගික ලක්ෂණයන් ය.

## 2.1 පදනම් වර්ෂය

ප්‍රමාණවත් දත්ත ප්‍රභවයන් නොතිබීම වැනි හේතූන් නිසා, වර්ෂ ගණනාවක ඇවෑමෙන්, පදනම් වසර 2002 සිට 2010 වසර කරා පමුණුවා ඇත. සමහර රටවල් ද ඒ හා සමාන අන්තර් කාල සීමාවන් යටතේ ස්වකීය පදනම් වර්ෂය යාවත්කාලීන කර ඇත. 2002 - 2010 කාල පරාසය තුළ, ආර්ථිකයේ වෙනස්කම්, නව පදනම් වසර යටතේ ජාතික ගිණුම්වල නිරූපිතය.

2010 වසර පදනම් වසර ලෙස ගත් කල්හි, 2010 වසරේ දළ දේශීය නිෂ්පාදිතය රුපියල් මිලියන 6,413,668 ක් වන අතර, 2002 වසර පදනම් වසර ලෙස ගත් කල්හි එය රුපියල් මිලියන 5,604,104 ක් විය. මෙය සියයට 14.4 ක මට්ටමේ වෙනස්වීමකි. එහෙත්, 2014 වසරේදී මෙම ප්‍රතිශතය 5.6 දක්වා පහත වැටිණ.

පහත දැක්වෙන 2.2 සිට 2.5 දක්වා ඡේදවල විස්තර කර ඇති හේතූන් නිසා, නව හා පැරණි පදනම් වර්ෂයන් යටතේ ගණනය කරණ ලද ජාතික ගිණුම් එක හා සමාන නොවිය හැකිය.

## 2.2 ජාතික ගිණුම් ක්‍රමවේදය භාවිතයට ගැනීම. (SNA)

ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කරමින්, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් "ජාතික ගිණුම් ක්‍රමවේදය" නමින් උපදෙස් සංග්‍රහයක් හඳුන්වා දී ඇත. එය 1953 වසරේදී මුල් වරට ප්‍රකාශයට පත් කරණ ලද අතර, 1968, 1993 හා 2008 වසර වලදී සංශෝධිතව ඇත. මෙහිදී, හැකි උපරිම පරාසයකට මෙම 2008 ජාතික ගිණුම් ක්‍රමවේදය උපයෝගී කර ගන්නා ලදී.

## 2.3 ජාත්‍යන්තර වර්ගීකරණයන් භාවිතය.

ආර්ථික ක්‍රියාකාරකම් වර්ගීකරණය සඳහා ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණය (ISIC) – 4 වන සංස්කරණය හඳුන්වා දී ඇත. එම නිසා, ඉතා පහළ මට්ටම දක්වා ආර්ථික ක්‍රියාකාරකම් ගණනය කිරීමට හැකිවනවාක් මෙන්ම ජාත්‍යන්තර සංසන්දනයන් සුසාධ්‍යකරණයටද හැකියාව ලැබේ. එම නිසා, ජාත්‍යන්තර සම්මත කර්මාන්ත වර්ගීකරණය (ISIC) – 4 වන සංස්කරණයේ දේශීය අනුවාදය; එනම් ශ්‍රී ලංකා සම්මත කර්මාන්ත වර්ගීකරණය (SLSIC) ජාතික ගිණුම් ගණනය කිරීමෙහි ලා, භාවිතයට ගන්නා ලදී.

## 2.4 නව දත්ත ප්‍රභවයන් භාවිතය සහ නව ක්‍රමවේදයන් උපයෝගී කර ගැනීම

ජාතික ගිණුම් ගණනය කිරීමෙහි ලා, වෙනත් බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවද මුහුණ පා ඇති ප්‍රධානතම ගැටළුව වන්නේ විධිමත් දත්ත ප්‍රභවයන් නොමැතිකමයි. මෙතෙක්, ජාතික ගිණුම් ගණනය කරණ ලද්දේ මෙම සීමාවන්ට යටත්වය. එහෙත්, මෙතෙක් ප්‍රමාණවත් දත්ත ප්‍රභවයන් නොමැතිවූ ආර්ථික ක්‍රියාකාරකම් සඳහා නව දත්ත ප්‍රභවයන් ගණනාවක්ම දැන් හඳුනාගෙන ඇත. ඒ අනුව, උපදේශණ, පුහුණු වැඩ සටහන්, වැඩමුළු හා වෙනත් රටවල අත්දැකීම් අධ්‍යයනයන්හිදී හඳුනාගන්නා ලද ක්‍රමවේදයන් උපයෝගී කර ගන්නා ලදී.

## 2.5 නිෂ්පාදන ක්‍රියාදාමයේ සීමාවන් විස්තාරණය කිරීම

දත්ත නොමැතිකම වැනි ප්‍රායෝගික ගැටළු හේතුවෙන් ආර්ථිකයේ නව ක්‍රියාකාරකම් සමහරක් ආවරණය කිරීම මෙතෙක් දුෂ්කරව පැවතිණ.

උදාහරණයක් වශයෙන්, සමහර ගෘහස්ථ ආර්ථික ක්‍රියාකාරකම් නිරාවරණය කර ගැනීම දැක්විය හැකිය. නමුත්, නව ක්‍රමවේදයන් උපයෝගී කර ගැනීම සහ නව දත්ත ප්‍රභවයන් භාවිතය නිසා, ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් හැකිතාක් දුරට ආවරණය කර ඇත.

## 2.6 නව පදනම් වර්ෂය යටතේ, ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමේ සැලැස්ම.

- 2015 සිව්වන කාර්තුව දක්වා, 2002 වසර පදනම් වර්ෂය ලෙස සැකසුණු ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කෙරෙණු ඇත.

- 2010 නව පදනම් වර්ෂය යටතේ, 2010 පළමුවන කාර්තුවේ සිට කාර්තුගත වශයෙන්ද, වාර්ෂිකවද ජාතික ගිණුම් ප්‍රකාශයට පත් කෙරෙණු ඇත.

- කිසියම් කාර්තුවක ඇස්තමේන්තු එකී කාර්තුව ඇවෑමෙන් දින 75 ක් ඇතුළත ප්‍රකාශයට පත් කෙරෙණ අතර, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ දැක්වෙන දත්ත මුදා හැරීමේ දින දර්ශණය ඔස්සේ, මෙම දින ප්‍රකාශයට පත් කෙරෙණු ඇත.

## 2.7 පදනම් වර්ෂය සංශෝධනය කිරීමේ කාල පරාසය

ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා පදනම් වර්ෂය ක්‍රමිකව යාවත්කාලීන කළ යුතු වෙයි. ඒ අනුව, ආර්ථිකයේ වෙනස්කම් නිරූපණය අරමුණු කොට ගෙන, යටත් පිරිසෙයින් සෑම පස් වසරකට වරක් පදනම් වර්ෂය සංශෝධනය කෙරෙණු ඇත.

## 2.8 ජාතික ගිණුම් සංශෝධන ප්‍රතිපත්තිය

ජාතික ගිණුම් සංඛ්‍යාලේඛන වල සමහර උප කොටස් සම්පාදනයට පෙර අදාල දත්ත ප්‍රභවයන් සමහරක් සූදානම්ව නොමැති අවස්ථා ඇත. එම නිසා, වෙනත් රටවලද පවත්නා පරිදි, ශ්‍රී ලංකාවේද, ජාතික ගිණුම් සංශෝධන ප්‍රතිපත්තියක් හඳුන්වා දී ඇත. ඒ අනුව, කිසියම් කාර්තුවක් වෙනුවෙන් නිකුත් කරණ ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු, අවසාන අදාල දත්ත ප්‍රභවයන් ලබා ගැනීමෙන් පසුව වුවද සංශෝධනය කළ හැක. එවන් සංශෝධන සඳහා වන කාලරාමුවද ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරෙණු ඇත.

**3.** ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) විසින් සිදුකරන ලද ජාතික ගිණුම් හා මිල සංඛ්‍යාති වැඩිදියුණු කිරීමේ වැඩසටහන
(ජාතික ගිණුම් ක්‍රමවේදය හා ජාත්‍යන්තරව සැසඳීමේ ක්‍රමවේදය හඳුන්වාදීමේ ව්‍යාපෘතිය)

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් දියත් කළ ජාතික ගිණුම් ඇස්තමේන්තු වැඩිදියුණු කිරීමේ වැඩසටහන සඳහා තෝරාගත් රටවල් අතර ශ්‍රී ලංකාව ද වේ. 2011 – 2015 කාල පරාසය තුළ මෙම ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලද අතර, එමගින් පුහුණු වැඩසටහන් හා උපදේශක සේවාවන් ලබාදීම වැනි සහයෝගීතාවන් ලබා දෙන ලදී. මෙම වැඩසටහන යටතේ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජාතික ගිණුම් ගණනය කිරීම, පදනම් වර්ෂය වෙනස් කිරීම වැනි කාර්යයන් සඳහා පුහුණු කිරිම සිදුකරන ලදී.

**4.** පැරණි හා නව දළ දේශීය නිෂ්පාදිතයේ මට්ටම් සංසන්දනය කිරීමේ හැකියාව
දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ පදනම් වර්ෂය වෙනස් කිරිම මගින් ආර්ථිකය පිළිබඳ වඩාත් නිවැරදි දත්ත ලබාදීමට හැකිවීම තුලින් වඩාත් නිවැරදි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට හැකියාව ලැබේ.

2002 හා 2010 පදනම් වර්ෂ සඳහා දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ආර්ථික කටයුතු ආවරණය කිරීමේ වෙනස්කම්, දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ ක්‍රමවේදවල හා භාවිතා කළ ආර්ථික කටයුතු වර්ගීකරණවල වෙනස්කම් නිසා පැරණි හා නව පදනම් වර්ෂවල ජාතික ගිණුම් සංසන්දනය කළ නොහැකිය.

**5.** නව දළ දේශීය නිෂ්පාදිතයේ අගය ශ්‍රේණි

අ. ජාතික ගිණුම් ගණනය කිරීම සඳහා , 2015 දෙවන කාර්තුවේ සිට, 2010 වසර පදනම් වර්ෂය ලෙස භාවිතා කෙරේ. එම නිසා, 2010 වසර පදනම් වර්ෂය ලෙස ගෙන සකස් කරණ ලද, දළ දේශීය නිෂ්පාදනය, එහි වර්ධන වේගය සහ වෙනත් සාර්ව ආර්ථික ගිණුම් නිල සංඛ්‍යාලේඛන ලෙස සැළකිය යුතුවේ.

ආ. **2002 වසර සහ 2010 වසර පදනම් වර්ෂ සේ සලකා 2010 සිට 2014 දක්වා ගණනය කරන ලද දළ දේශීය නිෂ්පාදිත වටිනාකම් වගු අංක 1හි සංසන්දනය කර ඇත.**

ඇ. **2002 වර්ෂය පදනම් වර්ෂය ලෙස ගෙන ජාතික ගිණුම් ගණනය කිරීම 2015 වර්ෂයේ සිව්වන කාර්තුවෙන් අවසන් කෙරේ.**

**1 වන වගුව: වර්ෂ 2010 සිට 2014 සඳහා, 2002 හා 2010 පදනම් වර්ෂයන් භාවිතයෙන් සකස් කරණ ලද දළ දේශීය නිෂ්පාදිතය හා ආර්ථික වර්ධන වේගයන්**

| වර්ෂය | පදනම් වර්ෂය: 2002 | | | පදනම් වර්ෂය: 2010 | | |
|---|---|---|---|---|---|---|
| | දළ දේශීය නිෂ්පාදිතය (වත්මන් මිල අනුව) (රු.මිලියන) | දළ දේශීය නිෂ්පාදිතය (ස්ථාවර මිල අනුව) (රු.මිලියන) | වර්ධන වේගය(%) | දළ දේශීය නිෂ්පාදිතය (වත්මන් මිල අනුව) (රු.මිලියන) | දළ දේශීය නිෂ්පාදිතය (ස්ථාවර මිල අනුව) (රු.මිලියන) | වර්ධන වේගය(%) |
| 2010 | 5,604,104 | 2,645,542 | | 6,413,668 | 6,413,668 | |
| 2011 | 6,543,258 | 2,863,691 | 8.2 | 7,219,106 | 6,952,720 | 8.4 |
| 2012 | 7,578,555 | 3,045,288 | 6.3 | 8,732,463 | 7,588,517 | 9.1 |
| 2013 | 8,674,228 | 3,265,809 | 7.2 | 9,592,125 | 7,846,202 | 3.4 |
| 2014 | 9,742,240 | 3,506,664 | 7.4 | 10,291,581 | 8,195,979 | 4.5 |